මුහුදුබඩ පත්තු ප්‍රාදේශිය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 02 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 20 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය
--------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව මුහුදුබඩ පත්තු ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩ පත්තු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු ආදායම්, වියදම් , වත්කම් සහ වගකීම් යටතේ විග්‍රහ කොට පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම | | වියදම් | | වගකීම් | | වත්කම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| අඩුවෙන් දැක්වීම් | 4 | 167,682 | - | - | 1 | 4,790 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 1 | 220,451 | 2 | 122,477 | - | - |
| අත්හැරීම් | - | - | - | - | 1 | 158,054 | 1 | 273,465 |

(ආ) සභාවට පරිත්‍යාග කරන ලද සීසෑමේ යන්ත්‍ර 14ක් හා බවුසර්08 අගය කොට ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.35,941,771 ක් වටිනා ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,516,199 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,904,949 ක් විය.

2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛණය නිසි ලෙස පිළියෙල කර නොතිබුණු බැවින් අයවැයගත සහ තථ්‍ය ආදායම සහ වියදම අතර පිළිවෙලින් රු.782,647 ක් සහ රු.6,842,139 ක් වූ විචලනයන් විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලන

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් සහ බදු | 187 | 207 | - |
| බදු කුලී | 9,045 | 12,116 | - |
| බලපත්‍ර ගාස්තු | 555 | 1,311 | - |
| වෙනත් ආදායම් | 21,392 | 18,324 | 178 |
| | 31,179 | 31,961 | 178 |

2.3.2 වීදි පහන

------------

සභාවේ විදුලිබල කාර්යයන් 1999 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයට පවරා තිබුණි. නමුත්, සභාව විසින් වීදි පහන් සවිකිරිම සඳහා වැයකරන ලද රු. 273,465 මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබු ණි.

.

2.3.3 උසාවි දඩ

-------------

සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.4,664,333 ක් ගිණුම් ගතකර නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

--------------

සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.2,468,180 ක් වු මුද්දර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-----------------------------

2.4.1 නිෂ්ක්‍රීය භෞතික සම්පත්

------------------------------

සී සැමේ යන්ත්‍ර 03ක් බවුසර් 02ක් හා පාපැදියක් සමාලෝචිත වර්ෂය තුල නිෂ්ක්‍රියව තිබුණි.

2.4.2 සමික්ෂණ මණ්ඩල වාර්තා

------------------------------

(අ) සමික්ෂණ මණ්ඩල වාර්තා අනුව ප්‍රයෝජනයට ගත නොහැකි බවට සඳහන් අයිතම් 08 කට අයත් භාණ්ඩ 14ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොත් ශේෂයන් සහ භෞතික ශේෂයන් සැසදීමේදි අයිතම් 03කට අයත් භාණ්ඩ 09ක ඌනතාවන් අනාවරණය විය.

2.4.3 හිඟ කාර්ය මණ්ඩල ණය

-------------------------------

ස්ථාන මාරු වී යන ලද සභා සේවකයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය රු.564,048 ක් අයකර ගැනිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.5 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති, රිති, රෙගුලාසි වලට අනුකූල නොවිම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රිති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රිති - 1988 | |
| (i) III පරිච්ඡේදය 12(I)වගන්තිය - | වරිපනම් සහ බදුවලට අදාළ ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | III පරිච්ඡේදයේ 29 වගන්තිය | - | දෛනිකව එකතුවන මුදල් බැංකුගත කර නොතිබුණි. |
| (iii) | III පරිච්ඡේදයේ 59 සහ 60 වගන්තිය | - | ව්‍යාපාර බදු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iv) | III පරිච්ඡේදයේ 65 වගන්තිය | - | ආදායම් නිලධාරියා විසින් ව්‍යාපාර බලපත්‍ර ගෙවීම පැහැරහැරි අයගේ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | ලේකම්වරයා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව හිඟ හිටි එකතුව රු 178,083 ක් වූ කඩකුලී සහ ගවමස් කඩ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (vi) | IV පරිච්ඡේදයේ 97 වගන්තිය | - | ගෙවීම් වවුචර් වල සඳහන් වැඩසටහන් සහ වියදම් විෂයයන් අයවැය ලේඛනයෙහි සඳහන් ආකාරයට සටහන් කර නොතිබුණි. |
| (ix) | V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | නියමිත දිනට නොපියවූ අත්තිකාරම් රු.635,421 ක් සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 අංක 10 දරන එකතු කළ අගය මත බදු පනත | - | යම් මාසයකට අදාල එකතු කළ අගය මත බදු ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. නමුත් 2010-2012 කාලය තුල අයකළ රු.2,886,578 ක් වූ එකතු කළ අගය මත බදු විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | - | 2010-2012 කාලය තුල එකතු කරන ලද රු.532,124 ක් වූ ජාතිය ගොඩනැගිමේ බදු දේශිය |

ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

2.6.1 ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතු වූ රු.1,860,000 කට ඇස්තමේන්තුගත කරන ලද ප්‍රධාන කාර්යාලීය උඩුමහල ඉදිකිරීම ප්‍රමාද වී තිබුණි. මේ සම්බන්ධයෙන් රු.2,960,000 ක මුදලක් ණයගැතියන් වශයෙන් ගිණුම් ගතකර තිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් එකතු කිරීම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) විවිධ තැන්පතු

(ඊ) අයවැය ලේඛනය